# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/IT/11/CRM | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2020.05.06 |

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථාන කළමනාකරු,

සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා බැංකු කළමනාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරි,

සමෘද්ධි බැංකු සමිති සභාපති හා බැංකු සභාපති.

## Covid –19 වසංගත හේතුවෙන් රුපියල් 5,000/- දීමනාව දුන් පුද්ගලයින් තොරතුරු පරිගණකගත කිරීම.

Covid –19 වසංගත හේතුවෙන් රුපියල් 5,000/- දීමනාව ලබාදුන් පුද්ගලයින් තොරතුරු පරිගණකගත කිරීම අරඹා ඇත. මෙම කාර්ය සිදු කිරීම සඳහා අප විසින් සමෘද්ධි සහනාධාරලාභීන් හා සමාජ ආරක්ෂණ ගෙවීම් කළමණාකරණය සඳහා නිපදවූ Samurdhi Subsidiary Information Management System පරිගණක මෘදුකාංගය යොදා ගන්නා ලදී.

මෙම මෘදුකාංගය Covid 19 Applications ලෙස සකස් කල මෙනුව භාවිතයෙන් රුපියල් 5,000/- මුදල ලබාදුන් පුද්ගලයින්ගේ තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම සිදු කරනු ලැබේ. (සමෘද්ධි සහනාධාර හා සමාජ ආරක්ෂණ ගෙවීම් කළමණාකරනයට අදාලව විස්තරාත්මක චක්‍රලේඛනයක් ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. )


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

රුපියල් 5,000/- ආධාරය හිමි වූ සමෘද්ධි සහනාධාරලාභී පුද්ගලයින්ගේ තොරතුරු පරිගණකගත ඇති අතර එම තොරතුරු අප සතුව ඇත. එබැවින් මේ අවස්ථාවේ දී පරිගණක මෘදුකාංගයට ඇතුලත් කරනුයේ අනෙකුත් ක්ෂේත්‍ර යටතේ ආධාර මුදල් ලබාදුන් පුද්ගලයින්ගේ තොරතුරු පමණි.

දැනට පද්ධතියට ඇතුලත් කර ඇති තොරතුරු වාර්ථාව සෑම දිස්ත්‍රික් කාර්යාලයක් විසින්ම පරීක්ෂා කළ යුතු අතර, ඒ සඳහා di**<District Name>** @ samurdhi.lk යන භාවිත නාමය (username) හා 12345 samurdhi.lk යන මුර පදය (password) භාවිතයෙන් පද්ධතියට ඇතුලත් විය හැකිය. පද්ධතියට පිවිසුනු පසු Reports මෙනුව තුල දෙවැනි පිටුවෙහි අවසාන වාර්ථාව වන **Covid 19 applicant count report – Ds-wise** තුලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු ඇතුලත් කර ඇති ප්‍රමාණය පරීක්ෂා කර බැලිය හැකිය.

සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් මෙය පරීක්ෂා කර බලා අඩු තොරතුරු ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පරිගණක දත්ත ඇතුලත් කරන්නන් (users) වැඩි කර තොරතුරු ඇතුලත් කිරීම වේගවත් කල යුතු ය. පරිගණකගත කරනු ලබන එක් පුද්ගල තොරතුරක් (record) වෙනුවෙන් රුපියල් 2ක් ගෙවිය යුතු ය. මෙම ගෙවීම් කටයුත්ත සමෘද්ධි සමිතිය හා සමෘද්ධි බැංකු විසින් කල යුතු ය. ඒ ඒ පරිගණක දත්ත ඇතුලත් කරන්නන් (user) පද්ධතියට ඇතුලත් කරන තොරතුරු ප්‍රමාණය මහසංගම් කළමණාකරු , අධ්‍යක්ෂ හෝ කලාප කලමණාකරු විසින් සහතික කර අදාල පුද්ගලයාට ගෙවිය හැකිය. මෙම ගෙවීම සම්බන්ධව ගිණුම් සටහන් තැබීමේ දී මිශ්‍ර වියදම් ගිණුම හර කොට මුදල් ගිණුම බැර කල යුතු ය.

රුපියල් 5000/-ක දීමනාවේ දෙවන වටය ද ආරම්භ කිරීමට නියමිත බැවින් එම මුදල් ලබා දීමේ දී මෙම පරිගණක නාම ලේඛන භාවිතයට ගත හැකි වන පරිදි මෙම කාර්යය 2020 මැයි මස 15 වන දිනට පෙර අවසන් කල යුතු ය. දැනට දත්ත ඇතුලත් කිරීමේ ප්‍රගතිය පරික්ෂා කිරීමේ දී සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ටාස ඉතා දුර්වල මට්ටමකින් පවතින බව ද නිරීක්ෂණය විය.

පරිගණක මෘදුකාංගයට තොරතුරු ඇතුලත් කිරීමේ දී වසමක භාවිත නාමයෙන් (USER NAME ) ඇතුලත් වූ පසු වෙනත් ප්‍රදේශයක තොරතුරු පෙන්නවන්නේ නම් වසමේ නම අගට බැංකුවේ නමෙහි මුල අකුර යොදා භාවිත නාමය ඇතුලත් කරන්න. Z (බැංකුවේ නම ) Samurdhi .lk ලෙස භාවිත නාමය ද (USER NAME) 12345 ලෙස මුර පදය ද භාවිත කොට පද්ධතියට පිවිස අදාල කලාපයේ ඇති සියලු තොරතුරු පද්ධතියට ඇතුල් කිරීමේ හැකියාව ඇත.

ඔබ දැනට පොදු මුර පදයක් password භාවිතයෙන් පද්ධතියට පිවිසේ. නමුත් මෙම තොරතුරු වල ආරක්ෂාව උදෙසා ඒ ඒ පරිගණක දත්ත ඇතුලත් කරන්නන් (USERS) වෙනම මුර පදයන් (password) වෙනස් කර ගත යුතු ය. එසේ මුර පදය වෙනස් කර ගැනීම සඳහා මුහුණුතෙහි වම් පස

උඩු ඇති භාවිතකරුගේ උඩ click කළ විට edit profile ලෙස ඇති කොටස කලින් මුර පදය වෙනස් කිරීම හා භාවිතකරුගේ විස්තර ඇතුලත් කිරීමේ දී කල යුතු ය.

මෙම තොරතුරු ඇතුලත් කරන වසමේ භාවිතකරු USER ලෙස පද්ධතියට පිවිසියේ නම් අදාල තොරතුරු ඇතුලත් කර මුර පදය වසම හා සමෘද්ධි සංවර්ධන නිලධාරියා වෙත ලබා දිය යුතු ය. මෙම පද්ධතිය සියළුම භාවිතකරුවන් තමාගේ මුරපදය භාවිතකරුට පුද්ගලික වන සේ වෙනස් කර ගත යුතු ය.

ජනාධිපති විශේෂ කාර්යය සාධන බලකායේ සභාපති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි මා විසින් විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් කරන ලද ඉල්ලීම මත CRM.eSamurdhi.gov.lk යන වෙබ් ලිපිනය සඳහා සම්බන්ධ වීමේ දී කිසිදු **අන්තර්ජාල ගාස්තුවක් අයකිරීමකින් තොරව** ලබා දීමට එකඟ විය. ඒ අනුව ලෙස සියලු අන්තර්ජාල සේවා සපයන ආයතන වෙත විදුලි සංදේශන නියාම කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීම අනුව සියළු අන්තර්ජාල සේවා සපයන ආයතන ගාස්තු අයකිරීමකින් තොරව පරිගණක මෘදුකාංග භාවිත කිරීමේ පහසුකම් සලසා ඇත. එබැවින් වියදමකින් තොරව මෙම කාර්යයට සම්බන්ධ වීමට කැමති පිරිසට පරිගණකගත කිරීමේ කාර්යයට තවදුරටත් සම්බන්ධ විය හැකිය.

මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර තොරතුරු තොරතුරු තාක්ෂණ අංශය ,

| | | |
|---|---|---|
| හිරාන් ප්‍රසන්න මයා | - | 071-4040891 |
| සමින්ද බණ්ඩානායක මයා | - | 071-8813836 |
| අත්තනායක මයා | - | 071-4901430 |
| තුෂාරි අබේසිංහ මිය | - | 071-4425369 |
| දේවන් රාජ් මය | - | 071-4396406 |

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:-**

1. ලේකම් - කාන්තා , ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
2. රාජ්‍ය ලේකම් - සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ස
3. ප්‍රධාන අභ්‍යන්තර විගණනක - අ.ක.ස
4. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) - අ.ක.ස